අහෝ බිලාල් ඔබ සලාත් ඉටු කරන්න; එමගින් සැනසුම ලබන්න

සාලිම් ඉබ්නු අබුල් ජඃද් තුමා විසින් වාර්තා කරන ලදී. මිනිසකු: මම සලාත් ඉටු කර
සැනසුම ලැබිය යුතු නොවේ ද! යැයි පැවසීය. එය ඔවුන් ඔහුට දොස් නගන්නාක් මෙන් විය.
එවිට ඔහු: අල්ලාහ්ගේ දූතයාණන් කරමින් සිටි ප්රකාශයකට මම සවන් දී ඇත්තෙමි යැයි පවසා මෙසේ දන්වා සිටියේය: "අහෝ බිලාල් ඔබ සලාත් ඉටු කරන්න; එමගින් සැනසුම ලබන්න"
[صحيح] [رواه أبو داود]

සහාබාවරුන් අතරින් මිනිසෙකු: 'මම සලාත් ඉටු කර විවේක ගත යුතු නොවේ ද' යැයි පැවසීය. එය ඔහු අවට සිටි අය ඒ සඳහා දොස් නගන්නාක් මෙන් විය. එවිට ඔහු 'අහෝ බිලාල්! ඔබ සලාතය සඳහා අදාන් උස් හඬින් පවසන්න. තවද ඒ සඳහා ඉකාමත් පවසන්න. එමගින් අපි සැනසුමට පත්වන්නෙමු. එය උත්තරීතර අල්ලාහ් සමග එහිදී ඇති කරගන්නා ඍජු සම්බන්ධතාවය හා හදවතට හා ආත්මයට දැනෙන සැනසුමයි'.යනු නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තමාණන් පවසනු මම අසා ඇත්තෙමි.' යැයි කීය.

https://sunnah.global/hadeeth/si/show/65095